# විහිළු තහළු සරදම් කර ආස්වාදයක් ලබන සතුන්

අනුන් කරන දේ බලා ඒ අයුරු කිරීමට යෑම සතාට සතුට උපදවන්නකි. සමහරවිට මේ නිසා හානි සිදුවීම් ද ඇති වේ. වඩාත්ම වඳුරන් අනිත් අයට හා සතුන්ට හිංසා කිරීමෙන් විහිළු කිරීමෙන් තෘප්තිය ලබයි. වඳුරා ගස් උඩට වී ජීවත්වන්නේ නිදගන්නේ රාත්‍රී කාලයේයි. මේ රාත්‍රී කාලයට වඳුරා යකාට බය නිසායයි ගැමියන්ගේ විශ්වාසයයි.

## මහාචාර්ය ලක්ෂ්මන් වෛද්‍යසේකර

සතුන්ට විහිළු තහළු කිරීමේ හැකියාවක් තිබේ ද? තමන්ගේ වර්ගයා මෙන් තමන් දෙස බලා සිටින අයටද විහිළු තහළු කිරීමේ හැකියාව සත්ත්ව ලෝකයේ දක ඇති දෙයකි. උසස් සතුන්වූ මිනිසා විහිළුව ආදරයෙන් පිළිගන්නාසේම එවැන්නක් සිදුකිරීමෙන් සතාත් එය විඳීමට භාජනය වන තැනැත්තාත් ලබන ආස්වාදයක් ලෙස අපට දැකිය හැක. මනස පිළිබඳ අදහස් දක්වන විද්‍යාඥයින් මේ සම්බන්ධව එකඟතාවකින් තොර ය. නමුත් නිතර සතුන් සමග ජීවත්වන අය මෙය සතුනගේ චර්යාවේ එක් අංගයක් ලෙස විදහා පායි. මේ නිසා සමහර සතුන්මේ සරදමින් ලබන තෘප්තිය ඔවුනගේ හැසිරීම අනුව දැන ගත හැක. ඒ අයුරුම විහිළු තහළු නිසා අනිකුත් අය ලබන සතුට හැසිරීමෙන් පෙන්වා දක්වයි.

පළමුව වඳුරන් ගැන බලමු. වඳුරන්ගේ චර්යාවට අදාළ විහිළු තහළු රැසකි. එනිසා ක්‍රියාවලියෙන්ම විහිළු උපදවන්නෙක් ලෙස සිතිය හැක. ශබ්ද නගා මිනිසුන් අවදිකිරීම හා සතුන්ගේ ක්‍රියාවලිවලට ඇඟිලි ගැසීම වඳුරන් ගැන දක ඇති දෙයකි. අනුන් කරන දේ බලා ඒ අයුරු කිරීමට යැම සතාට සතුට උපදවන්නකි. සමහරවිට මේ නිසා හානි සිදුවීම් ද ඇති වේ.

වඩාත්ම වඳුරන් අනිත් අයට හා සතුන්ට හිංසා කිරීමෙන් විහිළු කිරීමෙන් තෘප්තිය ලබයි. වඳුරා ගස් උඩට වී ජීවත්වන්නේ නිදගන්නේ රාත්‍රී කාලයේයි. මේ රාත්‍රී කාලයට වඳුරා යකාට බය නිසායයි ගැමියන්ගේ විශ්වාසයයි. උදය පාන්දර නැගිටින වඳුරා මළපහ කර කෑගසයි. මේ බෙරිහන්දී කෑගසන්නේ යකා භය කිරීමටයි. සරදම් කර යකාට


ව්‍යාඝ්‍රයා

විහිළු තහළු කර පසුව දිවා කාලයේ චර්යාව සිදු කරයි. මෙය වඳුරන් ජීවත්වන පෙදෙස්වල වෙසෙන ගැමියන්ට පුරුදු වඳුරු විහිළු තහළු ක්‍රියාවලියකි. තමන්ගේම සගයන්ට විහිළු කිරීම වඳුරන්ගේ තවත් ක්‍රියාවකි. මේ වඳුරු වර්ගයාට අයත් චිම්පන්සියා තවත් නිදසුනකි. චිම්පන්සියා අනිකුත් සතුන්ගෙන් සහ මිනිසුන්ගෙන් ලත් පුරුදු අනුකරණය කිරීම නිසා සතුට ලබන සතෙකි. වානර ගෝත්‍රයට අයිති


වඳුරන්


කොලයක් විසිකර විහිළු තහළු කරන හිපපොටේමස්

ඔරන් ඔටන් ද මේ අයුරු ය. ඔරන් ඔටන්ට සිතාවිය හැක. එය සතා ලබන සතුට අනිකුත් අය සමග බෙදාගැනීමකි. වයස් ගත වන මෙම සතුන් කුඩා කාලයේ ලද අත්දැකීම් අනුව විහිළු තහළු කිරීම එසේම සිදු කරයි.

මේ අයුරු ම අලි ඇතුන් ගැන බලමු. පසුගිය දිනක අපි ලාහුගල වැවේ සැරිසරමින් සිටි පත්ගස් කමින් ඇවිදින වල් අලින් දෙස වනජීවී නවාතැන් පොළ සිට බලා සිටියෙමු. එම ඇතුන් පත් කන විට එහාමෙහා වන අනිකුත් සතුන් අහුලා කෑමට ගිය කොක්කු ඇතාගේ පිට උඩ ගමන් කරයි. මේ කොකුන්ගේ හැසිරීම ගැන විනෝද වූ ඇතා පිට උඩ ඇවිදින කොකුන්ට හොඬවැල උස්සා වතුර විදිමින් විහිළු තහළු කර ඉවත් කරයි. නැවතත් කොකුන් ඇතාගේ පිට උඩට පැමිණෙයි. මෙම කොකුන්ට හිංසා කිරීමක් නොව ඇතැගේ විනෝදවීමක් ලෙස අපි දුටුවෙමු.

ඔවුන්ගේ හැසිරීම අනුව විහිළු තහළු කරන අයුරු දැක ගත හැක. වරක් ඉන්දියාවේ ඔටු රැළක් බලා ගත්තා සේවකයකුගේ උඩ සාක්කුවේ බහා තිබී ලැයිස්තු පොත ගෙන බිම දමා විහිළු කිරීම ඔටුවනගේ සිරිතක් විය. ඔටුවන් කැමරාවට හසු කිරීමට තැත් කරන කැමරාකරුවන්ගේ උපකරණ ලෙවකා බැලීම ද තවත් විහළු තහළු කිරීමේ විදිහකි. මේ අයුරුම අප දැක ඇති වලසුන්ගේ විහිළු තහළුවකි. වලස් නැටුම විනෝදවීම සඳහා වලස් රැළ යොදා ගත් දෙයකි. මෙම සත්තු ද වඳුරන්ගේ චර්යාවට සමාන ක්‍රියා රැසක් සිදුකරති. වරක් අපි සිසුන් පිරිසක් ද කැටුව ජීව විද්‍යා චාරිකාවකට ත්‍රිකුණාමලයට ගියෙමු. ත්‍රිකුණාමලයේ කෝනේශ්වරම් කෝවිල පිහිටි ගල්තලාව උඩ සිට පහත බලන අයට ඝන කැලෑවක් දිස්වෙයි. හඳ ඇති රැයක වලස් රංචුවක් දැක ගැනීමට අපට හැකි විය. එම වලසුන් එක් වී දෙතුන් දෙනෙක් පමණ එකතුව නැටුමක් රඟපායි. එය මිනිසුන් එකතු වී නටන බාල් නැටුමක් ලෙස විය. එය බලා සිටින අනිකුත් සතුනට සරදම් කිරීමටත් වලසුන් ආස්වාදයක් ලැබීමටත් කරන දෙයකි. වලසුන්ගේ ලෝකයේ මේ අයුරු නිදහසේ විහිළු තහළු කර සතුට විඳීමට කළ දෙයක් යයි සිතමු.

බළල් ගණයට අයිති සතුන්ගේද සතුටුවීම අප දැක ඇත. බළලා මීයෙක් අල්ලා ගත්විට ඉක්මනින් ගොදුර ආහාරයට නොගනී. මෙය ඔවුන් සතුට ලබන දෙයක් ලෙස සැලකිය හැක. මීයා විසි කර එහා මෙහා දමා සෙල්ලම් කර ආහාරයට ගැනීමට පෙර තෘප්තියක් ලබා ගනී. මෙම ගනයට අයිති ලොකු සතුන් වන කොටියා, ව්‍යාඝ්‍රයා සතුන් මරාගෙන අනුභවයට පෙර තම ඇගේ ඇති හම සහ රෝම සෙලවීමක් සිදු කරයි. ඒවා හැකිලවීමක් කරයි. හම රැල්ලක් නිපදවීම නිසා විනෝද සුවයක් ලබන දෙයක් ලෙස අපට පෙනේ.

මෙය හිපපොටේමස් ගැන දැක ඇති දෙයකි. හිපපොටේමස් ජීවත් වන වතුර උඩට වැටෙන කොළ සමග විහිළු තහළු කිරීම සඳහා කට ඇර නාසය තුළින් හුළං රොදක් එවා කොළ උඩ දමයි. මේ උඩ දැමීම එක් වරක් නොව කීපවරක්ම සිදු කරන්නේ සරදමක් ලෙසිනි. මෙම සතා මින් සතුටක් ලබයි.

කුරුළු ලෝකයේ ද මෙය දැක ඇති දෙයකි. අඩුවුවත් නිරීක්ෂණව බලා සිටින විට දැක ගත හැක. පිහාටු සෙලවීමෙන් සිදුකරන දෙය එක් කරුණකි. සතුන් පලවා හැරීමට ගීයෙහි හඬ වෙනස් කර සතුටක් ලබයි. ගිරවුන්ද මේ අයුරු තෘප්තියට පත්වෙයි. අනිකුත් සතුනගේ අනුකරණය ලබා සතුටුවන කුරුළු විශේෂ ඇත. ඉන් එක් කුරුල්ලෙකි 'කාකුබෑනා'.

කාකුබෑනා කුරුල්ලෙකු වරක් බළලෙකුගේ කටහඬ හා ස්වරය ලැබෙන දෙය දෙස බලාසිට මේ විහිළු කරන අනුකරණ කටහඬ නගන බව දැක ගතිමි. මේ කුරුල්ලා ළඟ ඇති වැලක් උඩ සිට බිම යන බළලෙක් ලෙස ඒ කටහඬ අනුකරණය කර වින්දනයක් ලබයි.

අපේ ලෝකයට වඩා වෙනස් ලෝකයක ජීවත්වන සතුන් සහ කුරුල්ලන් විහිළු තහළු කර ආස්වාදය ලබා ගත්තා අයුරු පෙනේ. මිනිසාට පමණක් හිමිවූ දෙයක් නොව විහිළු තහළු කිරීම සරදම සෑම සතෙකුටම සොබා දහම දී ඇති විශිෂ්ට දයාදයකි. ❑